00109

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පෙරපාසල් අධ්‍යාපනය පිළිබඳ උසස් සහතික පත්‍ර වැඩසටහන 2018/2019

අවසාන පරීක්ෂණය - 2020

ESC2217/EPA2517/EPE2517/EPC2517 - මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ සමාජ සංස්කෘතික පර්යාලෝකය

කාලය - පැය තුනයි.(03)

---

දිනය 18.07.2020 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරාගනු ලබන ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. ප්‍රාථමික සමාජානුයෝජනය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ද්විතික සමාජානුයෝජනය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

03. පෙර පාසල් දරුවන් සඳහා ඉගෙනුම් පරිසරය සකස් කිරීමේ දී මාරියා මොන්ටිසෝරිගේ දර්ශනයෙහි වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

04. ළමා කේන්ද්‍රීය අධ්‍යාපන සංකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා රූසෝගේ දායකත්වය පිළිබඳව කෙටියෙන් දක්වන්න.

05. ශ්‍රී ලංකාවේ මව්වරුන් සංක්‍රමණය වීම ඔවුන්ගේ දරුවන්ගේ සංවර්ධනය කෙරේ සිදු කරන බලපෑම කෙටියෙන් පැහැදිලි කරන්න.

06. තම දරුවන් රැක බලා ගැනීමේ දී න්‍යෂ්ටික පවුල් මුහුණ දෙන ගැටලු පහක් (05) දක්වන්න.

07. සුදුසු නිර්වචන යොදා ගනිමින් අවාසිදායක දරුවන් යන යෙදුම කෙටියෙන් පැහැදිලි කරන්න.

08. ඔබගේ පෙර පාසල් අවු 4-5 වයසේ පසුවන දරුවන්ට පැවරිය හැකි වගකීම පහක් (05) ලැයිස්තුගත කරන්න.

(ලකුණු 8 x 5 = 40)

00109

## 2 වන කොටස

09. (i) පවුල යන යෙදුම සුදුසු නිර්වචන යොදා ගනිමින් නිර්වචනය කරන්න.(ලකුණු 04)

(ii) උණුසුම් පිළිගැනීම් සහිත පවුලක ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 06)

(iii) ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික පවුල් ව්‍යුහය වෙනස්වීම කෙරේ බලපෑ හේතු පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. (i) තම දරුවන් රැක බලා ගැනීමේදි කේවල පවුල්වල දෙමාපියන් මුහුණ දෙන ගැටලු **හතරක් (04)** දක්වන්න. (ලකුණු 04)

(ii) දරුවන්ගේ පූර්ණ සංවර්ධනය කෙරෙහි පවුලෙන් ලැබෙන දායකත්වය පිළිබඳව විශ්ලේෂණය කරන්න. (ලකුණු 06)

(iii) තම දරුවන්ගේ සංවර්ධනයට සහයවීම සඳහා දෙමාපියන් දැනුවත් කිරීමේ දී ඔබ අවධානය යොමු කරන කරුණු **තුනක් (03)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. (i) අවාසි සහගත පරිසර තුළ වැඩෙන දරුවන් කෙරේ බලපාන අහිතකර සාධක **හතරක් (04)** දක්වන්න. (ලකුණු 04)

(ii) ඉන් එක් සාධකයක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) අවාසිදායක පරිසරයන්ගෙන් පැමිණෙන දරුවන්ට ඉගෙනීමට සහය වීම සඳහා පාසල් ගුරුවරුන්ට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාදැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. (i) පෙර පාසල් දරුවන්ගේ සමාජානුයෝජනය කෙරෙහි සමවයස් කණ්ඩායම් අතර අන්තර් ක්‍රියාකාරිත්වය කෙසේ බලපාන්නේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) කුඩා දරුවන්ගේ සමාජානුයෝජනය කෙරෙහි පවුල තුළින් ඇති කරන බලපෑම උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. (i) මුල් ළමාවියේ දරුවන්ගේ සමස්ත සංවර්ධනය කෙරෙහි නිවසෙහි භෞතික පරිසරයේ බලපෑම උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) මුල් ළමාවියේ පසුවන දරුවන්ගේ සමස්ත සංවර්ධනය උදෙසා ඔබ විසින් පෙර පාසලේ භෞතික පරිසරය කෙසේ සකස් කරන්නේ දැයි උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.